# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1977/8 - 2016 ජූලි මස 26 වැනි අඟහරුවාදා - 2016.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2013

### (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත

(460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඉඩම් අමාත්‍ය.

2016 ජූලි මස 07 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2014 මැයි මස 30 වැනි දින අංක 1864/54 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2013 ඉඩම් අත්පත් කර ගැනීමේ (වන්දි ගෙවීම්) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 2 වන නියෝගයේ (2) වන ඡේදයේ (ඩ) අනු - ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනු - ඡේද ඇතුළත් කිරීමෙන් :-

''(ණ) මාතර - හම්බන්තොට දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම ;

(ත) මධ්‍යම අධිවේගී මාර්ගය.'' ;

(2) එහි 7 වන නියෝගයේ ''අමාත්‍යවරයා'' යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :-

''අමාත්‍යවරයා'' යන්නට ඉඩම් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ ; ''.

08 - 201


1A - G 23907 — 47 (2016/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*